# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIMS)

# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ තනතුර සඳහා නිසි පරිදි සුදුසුකම් ලත් අයවලුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි නාමාවලිය ප්‍රකාරව අධ්‍යක්ෂකවරයා පූර්ණකාලීන නිලධාරියෙකු වන අතර, හෙතෙම ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන අධ්‍යයන නිලධාරී සහ ගිණුම්කරණ නිලධාරියාද වේ. අධ්‍යක්ෂකවරයා නිල වශයෙන් ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකත්වය සහ සභාපති ධූරය දරන අතර, ආයතනයේ සෑම අධ්‍යයන මණ්ඩලයකම නිල වශයෙන් සාමාජිකයෙකු වේ. ධූර කාලය වසර තුනක් වන අතර, අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු මෙන්ම අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 63ට අඩු පුද්ගලයෙකු විය යුතුය.

අපේක්ෂිත අයදුම්කරු සතුව මණ්ඩල සහතිකය හෝ වෛද්‍ය විශේෂඥ පිළිබඳ ආචාර්ය උපාධියක් (Phd හෝ ඊට සමාන) තිබිය යුතුය. අධ්‍යාපන ආයතනයක පරිපාලන පළපුරුද්ද අමතර සුදුසුකමකි.

තෝරාගන්නා අයදුම්කරු බහුවිධ අධ්‍යයන පරිසරයක් තුළ රාජකාරී ඉටු කිරීමට අවශ්‍ය විශිෂ්ඨ අන්තර් පුද්ගල කුසලතා සහිත අයෙකු මෙන්ම ප්‍රජාව කෙරෙහි තිබෙන ආයතනයේ වගකීම පිළිබඳව අවබෝධයක් ද තිබිය යුතුය. අධ්‍යයන නායකත්වය ලබාදීම පිළිබඳව ඔහු/ ඇය වගකිවයුතු වේ.

තනතුරට අදාල වැටුපක් සහ වෙනත් දීමනාවන්ද ලබා ගැනීමට අධ්‍යක්ෂකවරයා සුදුසුකම් ලබයි.

**අයදුම්පත් සමඟ පහත දැක්වෙන ලියකියවිලි අමුණා එවිය යුතුය.**

i. උපන් දිනය ද ඇතුළුව අයදුම්කරුගේ සම්පූර්ණ ජීව දත්ත තොරතුරු පත්‍රිකාවක්.

ii. අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් ආයතනයේ සංවර්ධනය සඳහා ඉටුකිරීමට බලාපොරොත්තු වන දැක්ම පිළිබඳ ප්‍රකාශයක්.

iii. අයදුම්කරු රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුක්ත වන්නේ නම් ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි බව සඳහන් සේවා යෝජකයාගෙන් ලිපියක්.

අයදුම්පත් **2024 නොවැම්බර් 20 වන දින ප.ව. 3.30ට** හෝ ඊට පෙර ලැබෙන පරිදි, **"සහකාර ලේඛකාධිකාරී, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, ගැටඹේ, පේරාදෙණිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ පෞද්ගලිකව පැමිණ භාර දීම කළ හැකි අතර, අදාල කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"අධ්‍යක්ෂ තනතුර, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය"** යනුවෙන් සඳහන් කළ යුතුය. ඊට අමතරව, ඉහත දැක් වූ ලිපි ලේඛන සහ වෙනත් ආධාරක ලිපි ලේඛනයන්හි මෘදු පිටපත්, PDF ආකෘතියෙන් ar@pgims.pdn.ac.lk යන ඊමේල් ලිපිනය වෙත එවිය යුතුය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2024 ජනවාරි 01 දිනැති අංක 01/2024 දරන චක්‍රලේඛයේ දක්වා ඇති ක්‍රමවේදයට අනුව තෝරා ගැනීම සිදු කෙරේ. අධ්‍යක්ෂ තනතුර පත් කිරීමේ ක්‍රමවේදය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර ඉහත සඳහන් චක්‍රලේඛය පරිශීලනය කරන්න.

වැඩිදුර තොරතුරු සඳහා, සාමාන්‍ය රාජකාරී වේලාව තුළදී වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සහකාර ලේඛකාධිකාරිවරිය 081-2389757 දුරකථන අංකය ඔස්සේ අමතන්න.

**සහකාර ලේඛකාධිකාරී,**
**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය.**

**2024 ඔක්තෝබර් 20 වැනි දින**